## පඳුරු පාලනය

- මාස 4 දී එක් මොරෙයියෙකු ද
- පීදෙන අවස්ථාවේදී තවත් එක් මොරෙයියෙකු ද
- අස්වනු නෙලන අවස්ථාවේදී තවත් එක් මොරෙයියෙකු වැඩෙන්නට සලස්වන්න

## පොහොර යෙදීම

වියළි හා අතරමැදි කලාපය - ජල සම්පාදනය යටතේ

| වර්ගය | යොදන කාලය | වලකට | | |
| --- | --- | --- | --- | --- |
| කාබනික පොහොර | සිටුවීමට සති දෙකකට පෙර | කිලෝ ග්‍රෑම් 10 | | |
| රසායනික පොහොර | | පැළයකට/පඳුරකට ග්‍රෑම් | | |
| | | Urea | TSP | MOP |
| | සිටුවීමට දින 1-2 පෙර | 60 | 40 | 125 |
| | සිටුවා මාස 2 න් | 120 | 80 | 250 |
| | සෑම මාස 4 කට වරක් | 120 | 80 | 250 |

තෙත් කලාපය

| වර්ගය | යොදන කාලය | වලකට | | | |
| --- | --- | --- | --- | --- | --- |
| ඩොලමයිට් | සිටුවීමට සති දෙකකට පෙර | ග්‍රෑම් 500 | | | |
| කාබනික පොහොර | සිටුවීමට සති දෙකකට පෙර | කිලෝ ග්‍රෑම් 10 | | | |
| රසායනික පොහොර | | පැළයකට/පඳුරකට ග්‍රෑම් | | | |
| | | Urea | TSP | MOP | KE |
| | සිටුවීමට දින 1-2 කට පෙර | 55 | 50 | 95 | - |
| | සිටුවා මාස 2 න් | 110 | 100 | 190 | 100 |
| | සෑම මාස 4 කට වරක් | 110 | 100 | 190 | 100 |

## කැන් ආවරණය කිරීම



- ගුණාත්මය වැඩි කිරීම සඳහා
- ඇවරි තේරී අවසන් වූ පසු මුහය ඉවත් කරන්න
- පොලිසැක් බෑග් යොදා ආවරණය කරන්න

## අස්වනු නෙලීම

- කැන් මේරීමට ගතවන කාලය ප්‍රභේද අනුව වෙනස් වේ
- පවතින දේශගුණ තත්වය අනුවද මෙය සුළු වශයෙන් වෙනස් වේ.
- ගෙඩිවල පොත්තේ පැහැය ක්‍රමයෙන් තද කොළ සිට ලා කොළ පැහැයට හැරීම
- ගෙඩියේ දර ක්‍රමයෙන් අඩුවීම
- ගෙඩිවලට තට්ටුකර බැලූ විට ඇති වන ශබ්දයේ වෙනස


වැඩි විස්තර සඳහා
ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,
මාකඳුර, ගෝනවිල (වයඹ)
දුරකථන: 031-2299625
විද්‍යුත් තැපෑල: ardcmk@yahoo.com

තාක්ෂණික තොරතුරු සැපයීම
එච්.එම්. සරත්විමල (කෘෂිකර්ම උපදේශක)



Designed by: AUDIO VISUAL CENTRE,
Department of Agriculture, Peradeniya.


# කෙසෙල් වගාව




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2014

## හැඳින්වීම

විවිධ දේශගුණික තත්ත්ව යටතේ වගාකල හැකි වසර පුරාම අස්වනු ලැබෙන ආර්ථිකව ලාභදායි වගාවක් වන බැවින් මෙම පලතුර ලංකාව පුරාම ව්‍යාප්තව ඇත.

## ප්‍රයෝජන

- පලතුරක් හා ව්‍යංජනයක් ලෙස
- රසකැවිලි, පලතුරු බීම, ළදරු ආහාර වර්ග, ආයුර්වේද ඖෂධ හා මධ්‍යසාර නිෂ්පාදනයේදී

## දේශගුණික අවශ්‍යතා

- උච්චත්වය - මුහුදු මට්ටමේ සිට 1500m
- වර්ෂාපතනය - වසර පුරා පැතිරුණු 1250-1900mm
- උෂ්ණත්වය - 25-30$^0$C වඩා සුදුසුය

## පස

- ලෝම පස (හොඳ ජලවහනයක් සහිත ජලය රඳවා ගැනීමේ හැකියාව සතුටුදායක)
- පාංශු ගැඹුර 1.5m පමණ වීම
- පී.එච්. අගය 7 ට ආසන්න වීම

## කෙසෙල් වගා රටා

*1. තනි වගාවක් ලෙස*

| වර්ගය | පරතරය (අඩි) | පැළ අවශ්‍යතාවය (අක්කර 1 ක් සඳහා) |
|---|---|---|
| කෝලිකුට්ටු<br>බිං කෙසෙල් | 8x8 | 675 |
| ආනමාලු<br>ඇඹිබන් | 12x12 | 300 |
| අනෙකුත් වර්ග | 10x10 | 435 |

*2. අතුරු බෝගයක් ලෙස (පොල් වගාව තුළ)*

- පොල් පැළ සිටුවා මුල් වසර 05 තුළ හා වසර 25 ට වැඩි පොල් වගාවන් තුළ නිර්දේශ කෙරේ.
- පොල් පැළ අතර පරතරය - 8m x 8m

## සිටුවන ක්‍රම

1. එකේ එකේ පේලි ක්‍රමය



*පරතරය* - 4m x 4m
*අක්කරයකට අවශ්‍ය පැළ* - 150-175

2. දෙකේ දෙකේ පේලි ක්‍රමය



*පරතරය* - 2.7m x 2.7m
*අක්කරයකට අවශ්‍ය පැළ* - 400-425

3. දෙකේ තුනේ පේලි ක්‍රම



*පරතරය* - 2.7m x 2m
*අක්කරයකට අවශ්‍ය පැළ* - 550-575

## වගාවට සුදුසු ප්‍රභේද

| | පලතුරු ලෙස | ව්‍යංජන ලෙස |
|---|---|---|
| වියළි කලාපය | කෝලිකුට්ටු, ඇඹුල්, සීනි කෙසෙල්, කණ්ඩුල | දිය මොන්දන්, පුලතිසි, ඇටමුරු, අළුමොන්දන්, අළුකෙසෙල්, ප්‍රසාද්, කණ්ඩුල |
| අතරමැදි කලාපය | කෝලිකුට්ටු, ඇඹුල්, ආනමාලු, ඇඹිබන්, සීනි කෙසෙල්, කණ්ඩුල | දිය මොන්දන්, ප්‍රසාද්, අළුමොන්දන්, කණ්ඩුල, කිතල, අළුකෙසෙල්, පුලතිසි |
| තෙත් කලාපය | ඇඹුල්, ආනමාලු, ඇඹිබන්, සීනි කෙසෙල්, රත්කෙසෙල්, පුවාලු බිං කෙසෙල්, කණ්ඩුල | දිය මොන්දන්, පුලතිසි, ඇටමුරු, අළුමොන්දන්, කිතල, අළුකෙසෙල්, ප්‍රසාද් |

## පැළ සිටුවීම

වලක ප්‍රමාණය - අඩි 2x2x2

## රෝපණ ද්‍රව්‍ය

1. මොරෙයියන්
2. පටක රෝපණ පැළ
3. අල කැබලි මගින් සාදගන්නා පැළ

මොරෙයියන් වර්ග 3 කි



*කඩුපත් මොරෙයියා*
*සිටුවීමට වඩාත් සුදුසුය*



*කනපා මොරෙයියා*
*සිටුවීමට සුදුසුය*



*දියපත් මොරෙයියා*
*සිටුවීමට සුදුසු නැත*

## මොරෙයියන් තේරීම හා සැකසීම

- නිරෝගී වගාවකින් පැළ ලබාගන්න
- උස 75 cm හා කෝමයේ විෂ්කම්භය 15-20 cm පමණ පැළ තෝරා ගන්න
- දිරූ හා හානි වු කොටස් ඉවත් වන ලෙස කෝමය හොඳින් පිරිසිදු කරන්න

## මොරෙයියන් සඳහා පූර්ව ප්‍රතිකාර

**1. උණු ජල ප්‍රතිකාර ක්‍රමය**

100$^0$C උෂ්ණත්වයට රත්කර ගත් ජලයේ තත්පර 30 ක කාලයක් පැළයේ කෝමය කොටස ගිල්වා ගන්න.

**2 ක්‍රමය**

- අමු ගොම හා අළු ජලයේ මිශ්‍රකර උකු ද්‍රාවණයක් සකසා ගන්න
- ද්‍රාවණයේ විනාඩි 5-10 ක් පැළයේ කෝමය කොටස ගිල්වා ගන්න
- සෙවන සහිත ස්ථානයක සති 1 ක් පමණ තබා සිටුවීමට ගන්න